


# විදූෂාගේ සහ තමිල් චෙල්වන්ගේ මරණ

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න

දහඅට වියෙහි දී තම ආයුධ සන්නද්ධ අරගලකාරී ජීවිතය ආරම්භ කළ විදූෂා අවසන් යුද්ධයේ ආරම්භක අවස්ථාවේ දී හතළිස් වන වියට ආසන්නව උන්නාය. බොහෝ යුද පෙරමුණුවල සටන් කර සිරුරේ බොහෝ තුවාල සහිතව උන් ඇයට දිගින් දිගටම දුෂ්කර සටන් බිමේ ජීවිතයත් දිනපතා සිදුවන ජීවිත හානිත් අවසානයක් නොමැතිව දිග් ගැස්සෙන යුද්ධයත් බොහෝ බොහෝ සටන්කාමීන්ට මෙන් ඇය තුළ ද එක්තරා ආකාරයක අසහනකාරී තත්ත්වයක් ඇති කර තිබුණි. ඇතැම් අවස්ථාවල සෙන්පති විදූෂා ඉතාමත් කලකිරීමෙන් යුතුව විකෘති මනසින් කතා බහ කරන්නීය. මන්නාරමේ ආණ්ඩාංකුලම ප්‍රදේශයේ පිහිටි ඇයගේ අණදෙන මධ්‍යස්ථානයේ දී දිනක් මම ඇය සමඟ පිළිසඳරෙහි යෙදී සිටින විට ඇය "මේ යුද්ධයෙන් අපි දිනයි කියලා උඹ හිත-වද?"යැයි ඇසුවාය. මම ටික වේලාවක් ඇය දෙස බලාගෙන උන්නෙමි. "අපිට විතරක් ඇයි බන් මේ වගේ ජීවිතයක්. ලෝකේ කොයි තරම් වෙනස්වෙලාද අපි තවමත් කැළෑවලයි මඩ ගොහොරුවලයි මැරෙන එකනේ වෙන්නේ."

ලෙහෙසියෙන් පිළිතුරු සොයාගත නොහැකි ප්‍රශ්න සමඟින් අවසන් යුද්ධයේ දී පුදුකුඩුයිරුප්පු ආනන්ද පුරයේ දී විමුක්ති කොටින් අවසන් වතාවට සිදුකළ රිංගා ඇතුළු වී කරන ප්‍රහාරයකට සහභාගි වී වීර මරණයකට පත් වූ එම වීර කා-න්තා සෙන්පතිනියගේ මළ සිරුර කිසි කෙනෙකුගේ අවධානයට ලක් නොවී පරාජයේ උකුසු හොටට ගොදුරු වෙමින් තිබුණි.

පනස් වියට ආසන්න වෙමින් සිටි බොහෝ ජ්‍යෙෂ්ඨ සෙන්පතිවරු විශාල මානසික පීඩාවන් ද ඔවුන්ගේ දුර්වල ආහාර ගැනීම් ද දිගින් දිගටම සිදු කෙරෙන වෙහෙසකාරී හේතුවෙන් අධි රුධිර පීඩනය දියවැඩියාව පිට කොන්දේ අමාරුව ආදී වශයෙන් බො-හෝ ස්ථිර රෝගවලට පත්ව උන්හ. විමුක්ති කොටි සංවිධානයේ බොහෝ ජයග්‍රාහී ප්‍රහාර මෙහෙයවා සිටි ප්‍රමුඛ සෙන්පතියෙකු වන බ්‍රිගේඩියර් බාල්රාජ් දියවැඩියා රෝගයෙන් ඉතාමත් දරුණු ලෙසින් පීඩාවට පත්ව ඒ සමඟ තව බොහෝ ශාරීරික ආබාධ ඇතිවී දෙදහස් අට වසරේ දී අනපේක්ෂිත ලෙසින් මරණයට පත් විය. සංවිධානයේ දෙවෙනි පෙළ සෙන්පතිවරුන්ගේ වර්ධනය ඉතාමත් අඩුවීමක් තිබුණි යැයි කියනවාට වඩා තිබුණේම නැත යනුවෙන් පැවසීම වඩාත් සුදුසුය. ඉතාමත් දක්ෂ ගැහැණු සහ පිරිමි සටන්කාමීහු බොහෝ දෙනෙක් උසස් තත්ත්-වයන්ට අවශ්‍ය සුදුසුකම් සපුරා ඉදිරියට පැමිණෙමින් සිටියදී කෙටි කාලයක් ඇතුළත ඔවුහු සටන් බිමේ මරණය වැළඳගත් අවස්ථා අධික විය.

නායකතුමාගේ චින්තනයට අනුව සංවිධානයේ බොහෝ පරිපාලන ඒකක සහ අලුත් ප්‍රහාරයක බළඇණි ඇති කර තිබුණි. එහෙත් ඒවාට ප්‍රමාණවත් තරම් පිරිස් බලයක් තිබුණේ නැත. සැළකිය යුතු තරමේ සෙන්පතිවරු සහ සටන්කාමීහු සංඛ්‍යාවක් බොහෝ කාර්යයන් තම හිස මත දරාගෙන



උන්හ. එහෙයින් සෑහෙන ප්‍රමාණයක් පුහුණුවක් හෝ අතිරේඛ සූදානම්වීම් හෝ සිදුකළ නොහැකි තත්ත්වයක සංවිධානයේ සමස්ථ කාර්ය හැකියාව අඩුවෙන්නට විය. සැබෑ තත්ත්වය මෙසේ පවතිත්දී ගත වූ කාලය තුළ කොටින් විසින් අත්පත් කරගන්නා ලද යුද ජයග්‍රහණ පදනම් කරගෙන කොටින්ගේ මිලිටරිමය ශක්තිය පිළිබඳව ප්‍රතිබිම්භය ඉතාමත් විශාල ලෙසින් නිර්මාණය කර තිබුණි. මෙම කාරණයේ දී විදෙස්ගතව සිටින ජනතාවගේ විශ්වාසය ඉතාමත් දැඩි විය. නවීන විද්‍යුත් මාධ්‍ය මාර්ගයෙන් ප්‍රචාරය කරමින් තිබුණු විමුක්ති කොටින්ගේ හමුදා ශක්තිය බැහැරින් බලා සිටින විට විස්මයට පත්කරන අයුරින් තිබුණත් සැබෑ තත්ත්වය නම් එය අභ්‍යන්තරයෙහි හිස් කුහරයක් බවය.

දේශපාලන අංශ භාරකරු වූ තමිල්චෙල්වන් සහ ඔහුගේ සහයකයන් වූ සටන්කාමීහු හත් දෙනෙක් ගුවන් හමුදා ප්‍රහාරයකින් දෙදහස් හත වසරේ දී මිය ගියහ. තමිල්චෙල්වන්ගේ මරණය යනු නායකතුමාට බරපතල අවාසියක් විය. නායකතුමාගේ ඕනෑම අදහසක් ප්‍රශ්න ඇසීමකින් තොරව ක්‍රියාත්මක කරන දැඩි විශ්වාසදායක සටන්කාමියෙක් ලෙස ඔහු ක්‍රියා කළේය. නායකතුමාගේ පෞද්ගලික කටයුතු බොහොමයක් පවා ඔහු වගකීම් සහිතව ඉටු කිරීමේ කාර්යෙහි යෙදී උන්නේය. එක්දහස් නවසිය අනූ තුනෙහි සිට දේශපාලන අංශයේ පරිපාලනය තුළ මම තමිල් චෙල්වන් යටතේ කටයුතු කළෙමි. එක්කුස ඔත් සොහොයුරෙකුගේ අභිමිවීමක් සේ මට ඔහුගේ වියෝව දැනුණි. ඕනෑම වැඩ සැලැස්මක් අපිට පැහැදිලි කරන අවස්ථාවක පවා "නායකතුමා බලාපොරොත්තු වෙන්නේ මේක. ඒ නිසා අපි ඒ අනුවයි කටයුතු කරන්ඩ ඕනෑ." යනුවෙන් වචනයක් වචනයක් පාසා නායකතුමා ගැන සඳහන් කරයි. ඉලක්කයට වෙඩි තැබීමේ ඉතාමත් ශූරයෙකු වූ තමිල් චෙල්වන් තමිල්නාඩුවෙහි ආයුධ පුහුණුව ලබා නායකතුමාගේ ශරීරාක්ෂක බළඇණියෙහි කටයුතු කළේය. ඒ වනතෙක් මහත්තයාගේ වගකීම යටතේ පැවැති දේශපාලන අංශය එක්දහස් නවසිය අනුතුන වසරේ දි තමිල් චෙල්වන් වෙත බාර දුන්නේය. විමුක්ති කොටි සංවිධානයෙහි දේශපාලන අංශය භාරව ඔහු අවසානය දක්වා කටයුතු කළේය.

කාන්තා සටන්කාමීන් පිළිබඳව ඔහුගේ ප්‍රවේශය පවා නායකතුමාගේ අදහස් ඒ අයුරින් අනුගමනය කිරීම බව මම දැනගෙන උන්නෙමි. ඉතාමත් අත්දැකීම් අඩු මා වගකීම් භාර තනතුරක් දක්වා වර්ධනය කරනු ලැබුයේ තමිල් චෙල්වන් විසින් ය. කෙනෙකු සතු දක්ෂතාවන් පෙන්වා දී උනන්දු කරවා තව තවත් වර්ධනය වීමට අවස්ථාවක් ඇති කර දීමේ ආකල්පය ඔහු සතු විය. ඔහු එහිදී ස්ත්‍රී පුරුෂ යන භේදයන් නොතකයි. බොහෝ දුෂ්කර වැඩකටයුතුවලදී පිරිමි සටන්කාමීන්ට සමාන මට්ටමින්ම ස්ත්‍රී සටන්කාමීන් ද යොදවයි.

එක්දහස් නව සිය අනූහතර වසරේ දී මම කොක්කුවිල් හි පිහිටි ලිංගම් කඳවුර තුළ අධ්‍යාපන අංශයෙහි කටයුතුවල යෙදී උන්නෙමි. දේශපාලන අංශ භාරකරු තමිල්චෙල්වන් මාව අමතන බව එක්වරම මට දැනුම් දුන්නේය. ඉහළ තනතුරු දරන බොහෝ සටන්කාමීහු එහි පැමිණ ඔහු හමුවන බව මම දැන සිටියෙමි. එහෙත් මා වැනි සාමාන්‍ය සටන්කාමී සාමාජිකාවක් කුමන හේතුවකට කැඳවන්නේද යන චකිතයෙන් මම ඔහුව හමුවීමට ගියෙමි. "ආ... නංගි මෙහෙ එන්න. මම ඔයාට වැදගත් වැඩක් භාර දෙන්නයි හදන්නේ. ජේදුරුතුඩුව ප්‍රදේශයේ ප්‍රචාරක කටයුතු ඔයාට භාර දෙනවා. වගකීමෙන් යුතුව වැඩ කරන්ඩ ඕනෑ. අවශ්‍ය සම්පූර්ණ සහයෝගය මම දෙන්නම්. වහාම වැඩ කරන්ඩ ඕනෑ."

එසේ පැවසූ ඔහු කළ යුතු වැඩකටයුතු පිළිබඳව මාව දැනුම්වත් කර යැව්වේය. පළමු වෙනි වතාවට ස්ත්‍රී සහ පුරුෂ සටන්කාමීන්ව එකට එක් කරගෙන එම වැඩ සැළැස්ම ක්‍රියාත්මක කරවීම වර්ධනීය අත්දැකීම් රාශියක් ලබාදීමට හේතු විය.

එක්දහස් නවසිය අනූ නවය වසරේ දී මා දේශපාලන අංශයේ කාන්තා අංශය භාරව පත් කිරීමෙන් පසුව ඔහු මාව තමන් විසින් වර්ධනය කරවනු ලැබූ අයෙකුය යන උදාසීන ආකල්පයෙන් තොරව මගේ වගකීමට දක්වන ගෞරවය සමඟින් මට මඟ පෙන්නුවේය. එම නිසා අනෙකුත් පිරිමි වගකීම් භාරකරුවන් අතරෙහි මට යම් තරමින් හෝ හිස ඔසවා වැඩ කිරීමට හැකිවිය. වැඩ සැළසුම්වලදී බොහෝ වගකීම් භාර තනතුරු දැරුවන් සමඟ ගැටුම් ඇතිවන අවස්ථා මතුවෙයි. එවැනි අවස්ථාවලදී ඔහු මධ්‍යස්ථව තම අදහස් දක්වයි. ඔහුගේ හදිසි මරණයට පසුව පොලිස් අංශය භාරව සිටි නඩේසන් මහතා දේශපාලන අංශයෙහි භාරකරු තනතුරට පත් කෙරිණි. ඔහු ද නායකතුමාට ඉතාමත් විශ්වාසී අයෙකු විය.

දෙදහස් හත වසරේ සැප්තැම්බර් මාසයේ දී ලංකාවේ හමුදාව විසින් මන්නාරමෙන් ආරම්භ කරන ලද හමුදා ක්‍රියාන්විතය විශාල භූමි ප්‍රදේශයක් ආක්‍රමණය කරමින් වේගයෙන් ඉදිරියට එමින් තිබුණි. පෙර වකවානුවලදී මෙන් නොව මෙවර හමුදාවේ ක්‍රමෝපායික ඇතුළුවීම් වර්ගයෙහි ප්‍රහාර හේතුවෙන් ද අපගේ පාලනය යටතේ පැවැති ප්‍රදේශ වේගයෙන් අත්පත් කරගත්හ. හමුදාවේ 'ජය සිකුරු' මෙහෙයුම සිදු කෙරුණු අවස්ථාවේ කොටින්ට ඉතාමත් වාසිදායක අයුරින් තිබුණු වන්නි වනයේ සෑම සූක්ෂම අංශයක්ම මෙම අවස්ථාව වන විට හමුදාව හොඳින් දැනගෙන උන්නේය. කොටි පාලනය යටතේ පැවැති ස්ථාන අත්පත් කරගැනීම සඳහා හමුදාව විසින් දියත් කරන ලද අඛණ්ඩ ඉදිරිගාමී ක්‍රියාන්විතයන් එක් පසෙකින් සිදු කෙරෙමින් පවතිද්දී අනෙක් පසින් කොටින්ගේ පසු ඇණිවල ක්‍රියාමාර්ග අවහිර කිරීමේ සැළැස්මක් සහිතව ක්ලේමෝර් බෝම්බ ප්‍රහාර සහ ගුවන් ප්‍රහාර එල්ල කෙරිණ.